# සම්මා සමාධිය උපදවාගැනීම සඳහා උපයුක්ත ප්‍රතිපදා මාර්ගය[1]

අංග දහයකින් සමන්විත වූ පුද්ගලයා රහතන්වහන්සේ බව 'දසාංගසමන්නාගතො අරහා හොති' යන පාඨයෙන් ස්ඵුට කෙරේ (ම.නි. 3, 218). එහෙත් ආර්ය භූමිය කරා එළඹීම සඳහා අංග අටක් පමණක් ප්‍රමාණවත් වන හෙයින් අංග අටකින් සමන්විත ආර්ය අෂ්ටාංගික මාර්ගය බුදුරජාණන්වහන්සේ විසින් හඳුන්වාදෙන ලදී. එබැවින් එහි අවසන් අංගය වන සම්මා සමාධිය උපදවාගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය පිළිබඳ ව විද්වතුන් අතර ඒකමතිකත්වයක් නැත. විශේෂයෙන් සම්මා සමාධිය උපදවාගැනීම සඳහා ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුපිළිවෙළින් අනුගමනය කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවත් ස්වකීය අභිමතය පරිදි ඕනෑ ම මාර්ග අංගයකින් එය අනුගමනය කළ හැකි බවත් සමාජගත ව ඇති මතයකි. නමුත් දීඝ නිකායේ ජනවසභ සූත්‍රයේ දී ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුපිළිවෙළින් අනුගමනය කළ යුතු බවත් සම්මා සමාධිය උපදවා ගැනීම සඳහා මුල් අංග හත පූරණය කිරීම අත්‍යවශ්‍යය බවත් පෙන්වා දෙයි.

සම්බුද්ධ ශාසනය තුළ ප්‍රථමයෙන් ම ධර්මාවබෝධයට පත් වූ උතුමා වන්නේ අඤ්ඤා කොණ්ඩඤ්ඤ තවුසාණන් ය.

> ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදිඃ ''යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති''. (ස.නි. 5(2), 274)

උන්වහන්සේ ද ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කළ බවක් පෙළ සාහිත්‍යයෙන් ස්ඵුට නොවේ. ධර්මාවබෝධය සඳහා වන ඒකායන මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය පමණක් ම නොවන බව සාමගාම සූත්‍රාගත කරුණු තුළින් පැහැදිලි වේ. එහි සඳහන් වන පරිදි සත්තිස් බෝධිපාක්ෂික ධර්ම අංග අතුරෙන් කවරක් හෝ අනුගමනය කිරීමෙන් ආර්ය භූමිය කරා පැමිණිය හැකිය. ඒ බව මහා පරිනිබ්බාණ සූත්‍රයෙහි ද දක්වා ඇත. ඒ අනුව, සත්‍යාවබෝධය විෂයයෙහි කටයුතු කරන්නාහට ආර්ය අෂ්ටාංගික මාර්ගය එක් ක්‍රමවේදයක් පමණි. එහෙත් මේ බෝධි අංග අතර සම්බන්ධයක් පවත්නා බව වටහා ගත යුතුය.

මහාපරිනිබ්බාණ සූත්‍රයෙහි බෝධිපාක්ෂික ධර්ම පිළිබඳ විවරණයක් එයි. එහි මේ සසුන් බඹසර බොහෝ කල් පැවැත්ම වන්නේ ද, චිරස්ථිතික වන්නේ ද, ඒ සඳහා ඉගෙන සේවනය කළ යුතු සතර සතිපට්ඨාන, සතර සම්‍යක්ප්‍රධාන, සතර ඉද්ධිපාද, පඤ්ච ඉන්ද්‍රිය, පඤ්ච බල, සප්ත බොධ්‍යංග, ආර්ය අෂ්ටාංගික මාර්ය යන ප්‍රතිපදා පිළිබඳ ව සඳහන් වෙයි.

> යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං, තදස්ස බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. සෙය්‍යථීදං, චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්ච බලානි, සත්ත බොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො. (දී.නි. 2, 186)

---

[1] ඉලුක්වෙල ධම්මරතන හිමි, BA (Hons), MA, MPhil, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, බෞද්ධ දර්ශනය අධ්‍යයනාංශය, බෞද්ධ අධ්‍යයන පීඨය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. විද්‍යුත් ලිපිනයඃ idhammarathana@bpu.ac.lk

බෝධිපාක්ෂික ධර්ම අතර එන ප්‍රතිපදා අතරින් කිහිපයක් මෙහි දී විමසා බැලිය යුතුය. සතර සතිපට්ඨානය හා සතර සම්‍යක්ප්‍රධානය යන අංග දෙක ම ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි එන අංග දෙකකි. සතර සතිපට්ඨානය සම්මා සතිය යටතේ ද සතර සම්‍යක්ප්‍රධානය සම්මා වායාම යටතේ ද විග්‍රහ වෙයි. ඒ අනුව, සතර සතිපට්ඨානය හෙවත් ආර්ය මාර්ගයෙහි හත්වන අංගය වන සම්මා සතිය වැඩීමෙන් ද ආර්යභූමියට පිවිසිය හැකිය. එමෙන් ම සම්‍යක්ප්‍රදානය හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි හයවන අංගය වන සම්මා වායාමය වැඩීමෙන් ද ආර්ය භූමියට ප්‍රවිශ්ට විය හැකිය. ආර්ය අෂ්ටාංගික මාර්ගයට අනුව එහි අටවන අංගය වන සම්මා සමාධිය වැඩීමෙන් ද ආර්ය භූමියට බැසගත හැකිය. එනයින් බලන කළ පැහැදිලි වන්නේ ඒ ඒ අංග අනුගමනය කිරීමෙන් ආර්ය භූමිය කරා එළඹිය හැකි බව යි.

ගණක මොග්ගල්ලාන බ්‍රාහ්මණයා සහ බුදුරජාණන්වහන්සේ අතර ඇති වූ සංවාදයක් ගණක මොග්ගල්ලාන සූත්‍රයෙහි එයි. එහි දී බ්‍රාහ්මණය ධර්මයෙහි අනුපූර්ව ප්‍රතිපදාවක් ඇති බව පෙන්වාදෙන ඔහු, බුදුරජාණන්වහන්සේගේ ධර්මයෙහි ද අනුපූර්ව ප්‍රතිපදාවක් ඇත්දැයි විමසයි. එයට පිළිතුරු දෙමින් බුදුරජාණන්වහන්සේ තමන් වහන්සේගේ ධර්ම විනයයෙහි ද අනුපූර්ව ශික්ෂාවක්, අනුපූර්ව ක්‍රියාවලියක්, අනුපූර්ව ප්‍රතිපදාවක් දක්නට ලැබෙන බව දේශනා කරති.

> සක්කා බ්‍රාහ්මණ, ඉමස්මිම්පි ධම්මවිනයෙ අනුපුබ්බ සික්ඛා, අනුපුබ්බ කිරියා, අනුපුබ්බ පටිපදා පඤ්ඤාපෙතුං (ම.නි. 3, 90)

මහා පරිනිබ්බාණ සූත්‍රයේ ද එවැනි ම සඳහනක් එයි. සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂා වැඩිය යුතු ආකාරය එහි දී බුදුරජාණන්වහන්සේ පෙන්වා දෙති. සීලයෙන් සමාධියත්, සමාධියෙන් ප්‍රඥාවත්, ප්‍රඥාවෙන් සියලු ආශ්‍රවයන්ගෙන් මිදීමත් සිදුවන බව එහි දී විස්තර කරති.

> ''ඉති සීලං, ඉති සමාධි, ඉති පඤ්ඤා, සීලපරිභාවිතො සමාධි සමප්ඵලො හොති මහානිසංසොඃ සමාධිපරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා. පඤ්ඤාපරිභාවිතං චිත්තං සම්මදෙව ආසෙවෙහි විමුච්චති සෙය්‍යථිදංඃ කාමාසවා භවාසවා අවිජ්ජාසවා''ති (දී.නි. 2, 132)

කොසොල් රජු රථයෙන් රථයට මාරු වෙමින් ගමනාන්තය වන සාකේත නුවර දක්වා යන්නා සේ යමෙක් නිවන කරා ගමන් කරන බව රථවිනීත සූත්‍රයෙහි එයි. (ම.නි. 1, 370)

> එවමෙව බො ආවුසො සීලවිසුද්ධි යාවදෙව චිත්තවිසුද්ධත්ථා. චිත්තවිසුද්ධි යාවදෙව දිට්ඨිවිසුද්ධත්ථා. දිට්ඨිවිසුද්ධි යාවදෙව කඞ්කාවිතරණවිසුද්ධත්ථා. කඞ්ඛාවිතරණවිසුද්ධි යාවදෙව මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධත්ථා. මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි යාවදෙව පටිපදාඤාණදස්සනවිසුද්ධත්ථා. පටිපදාඤාණදස්සනවිසුද්ධි යාවදෙව ඤාණදස්සනවිසුද්ධත්ථා. ඤාණදස්සනවිසුද්ධ යාවදෙව අනුපාදාපරිනිබ්බානත්ථා. අනුපාදාපරිනිබ්බානත්ථං බො ආවුසො භගවති බ්‍රහ්මචරියං වුස්සතීති. (ම.නි. 1, 370)

දුතිය භික්ඛු සූත්‍රයේ දී රාගය ක්ෂය කිරීමක්, ද්වේෂය ක්ෂය කිරීමක් මෝහය ක්ෂය කිරීමක් වේ ද එය අමෘතය යයි කියනු ලැබේ. මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය ම අමෘතගාමී මාර්ගය යැයි එහි දැක්වේ.

යො ඛො භික්ඛු රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො ඉදං වුච්චති අමතං. අයමේව අරියො අට්ඨංගිකො මග්ගො අමතගාමීමග්ගො... (සං.නි. 5(1), 12)

එම මාර්ගය දක්වා එය අනුපිළිවෙළින් අනුගමනය කළ යුතු බව ජනවසභ සූත්‍රයෙහි දක්වා ඇත. ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් සම්‍යක් සමාධිය වඩනු පිණිස සම්‍යක් සමාධිය පිරිපුන් කරනු පිණිස, මේ සම්‍යක් සමාධිපරිෂ්කාර ධර්මයෝ (පරිවාර ධර්මයෝ) සත් දෙනෙක් කොතරම් මනා කොට පණවන ලද්දාහු ද. ඒ කවර සත් දෙනෙක් ද? යත්ඃ සම්‍යක්දෘෂ්ටිය, සම්‍යක්සංකල්පය, සම්‍යග්වචනය, සම්‍යක්කර්මාන්තය, සම්‍යගාජීවය, සම්‍යග්ව්‍යායාම ය, සම්‍යක්ස්මෘතිය යන මොහු ය.

අරහතා සම්මා සම්බුද්ධෙන සත්ත සම්මාසමාධිපරික්ඛාරා සම්මාසමාධිස්ස භාවනාය සම්මාසමාධිස්ස පාරිපූරියා. කතමෙ සත්ත? සම්මාදිට්ඨි, සම්මාසංකප්පො, සම්මාවාචා, සම්මාකම්මන්තො, සම්මාආජීවො, සම්මාවායාමො, සම්මාසති. (දී.නි. 2, 330)

සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටියාහට සම්‍යක්සංකල්පය පවතී, සම්‍යක් සංකල්පය ඇත්තාහට සම්‍යග්වචනය පවතී, සම්‍යග්වචනය ඇත්තහුට සම්‍යක්කර්මාන්තය පවතී, සම්‍යක්කර්මාන්තය ඇත්තහුට සම්‍යගාජීවය පවතී, සම්‍යගාජීවය ඇත්තහුට සම්‍යග්ව්‍යායාමය පවතී, සම්‍යග්ව්‍යායාමය ඇත්තහුට සම්‍යක්ස්මෘතිය පවතී, සම්‍යක්ස්මෘතිය ඇත්තහුට සම්‍යක් සමාධිය පවතී, සම්‍යක් සමාධිය ඇත්තහුට සම්‍යග්ඥානය පවතී, සම්‍යග්ඥානය ඇත්තහුට සම්‍යග්විමුක්තිය පවතී.

සම්මාදිට්ඨිස්ස හො සම්මාසංකප්පො පහොති, සම්මාසංකප්පස්ස සම්මාවාචා පහොති, සම්මාවාචස්ස සම්මාකම්මන්තෝ පහොති, සම්මාකම්මන්තස්ස සම්මාආජීවො පහොති, සම්මාආජීවස්ස සම්මාවායාමො පහොති, සම්මාවාසාමස්ස සම්මාසති පහොති. සම්මාසතිස්ස සම්මාසමාධි පහොති, සම්මාසමාධිස්ස සම්මාඤාණං පහොති, සම්මාඤාණස්ස සම්මාවිමුත්ති පහොති. (දී.නි. 2, 330)

චූළවේදල්ල සූත්‍රයේ දී ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිවිධ ස්කන්ධයන්ට බෙදිය හැකි ද නොයෙසේ නම් ත්‍රිවිධ ස්ඛන්ධයට ආර්ය අෂ්ටාංගික මාර්ගය ඇතුළත් කළ හැකි ද යනුවෙන් විසාඛ උපාසක විසින් විමසන ලදී.

අරියෙන නු ඛො අයෙ‍ය අට්ඨඞ්ගිකෙන මග්ගෙන තයො ඛන්ධා සඞ්ගහිතා, උදාහු තීහි ඛන්ධෙහි අරියො අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ගහිතොති? (ම.නි. 1, 706)

එයට පිළිතුරු දුන් ධම්මදින්නා තෙරණිය, ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිවිධ ස්කන්ධයන්ට බෙදිය නොහැකි බවත්, ත්‍රිවිධ ස්කන්ධයට ආර්ය අෂ්ටාංගික මාර්ගය ඇතුළත් කළ හැකි බවත් පෙන්වා ආර්ය අෂ්ටාංගික මාර්ගය ප්‍රඥා, සීල, සමාධි වශයෙන් දක්වාලී ය.

න ඛො ආවුසො විසාඛ අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන තයො ඛන්ධා සඞ්ගහීතා. තීහි ච ඛො ආවුසො විසාඛ ඛන්ධෙහි අරියො අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ගහීතොඃ යං චාවුසො විසාඛ සම්මාවාචා යො ච සම්මාකම්මන්තො යො ච සම්මාආජීවො, ඉමෙ ධම්මා සීලක්ඛන්ධෙ සඞ්ගහිතා. යො ච සම්මා වායාමො යා ච සම්මා සති යො ච

සම්මා සමාධි, ඉමෙ ධම්මා සමාධික්ඛන්ධෙ සඞ්ගහිතා. යා ච සම්මාදිට්ඨි යො ච සම්මාසඞ්කප්පො, ඉමෙ ධම්මා පඤ්ඤාක්ඛන්ධෙ සඞ්ගහිතාති. (ම.නි. 1, 706)

මෙහි දැක්වෙන පරිදි ප්‍රඥාව යටතට සම්මා දිට්ඨිය හා සම්මා සංකප්පය යෙදී ඇත. එසේ යෙදී ඇත්තේ දක්වා ඇති මාර්ගාංග අට ත්‍රිශික්ෂාවට ඇතුළත් කිරීමේ දී සම්මා දිට්ඨිය හා සම්මා සංකප්පය ඇතුළත් කළ යුතු වන්නේ ප්‍රඥාවට වන හෙයිනි. යම් හෙයකින් දසාංග සමන්නාගතය ත්‍රිශික්ෂාවට ඇතුළත් කළ යුතු වූ යේ නම් එවිට සම්මා ඤාණ සහ සම්මා විමුක්ති යන මාර්ගාංග දෙක ප්‍රඥාවට ඇතුළත් කරනු නිසැකය. එවිට අනුපූර්ව ශික්ෂාවෙහි ද වරදක් සිදු නොවේ.

ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමේ දී පුද්ගල ආධ්‍යාත්මය පියවර තුනකින් සංවර්ධනය වන බව මහාචාර්ය ඔලිවර් අබේනායක මහතා පෙන්වා දෙයි. ඒ අනුව, ආර්ය අෂ්ටාංගිය මාර්යේ මුල් අංග තුන වන සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා හා සම්මා කම්මන්ත සියලු දෙනා (උසස් ආධ්‍යාත්මික තලයකට නොපැමිණි) සඳහාත්, පස්වන අංගය වන සම්මා කම්මන්තය ආර්ය ශ්‍රාවකයා සඳහාත් අවසන් අංග තුන වන සම්මා වායාම, සම්මා සති සහ සම්මා සමාධිය භික්ෂුව (ගිහිගෙය අත්හල ශ්‍රාවකයා) සඳහාත් වන බව සූත්‍රාගත කරුණු අනුව තහවුරු කරයි.

උදාහරණ ලෙස විභංඞ්ග සූත්‍රය උපුටා දැක්විය හැකිය.

කතමා ච භික්ඛවෙ, සම්මදිට්ඨි? යං ඛො භික්ඛවෙ, . . .
කතමා ච භික්ඛවෙ, සම්මසඞ්කප්පො? යං ඛො භික්ඛවෙ, . . .
කතමා ච භික්ඛවෙ, සම්මාවාචා? යා ඛො භික්ඛවෙ, . . .
කතමා ච භික්ඛවෙ, සම්මාකම්මන්තො? යා ඛො භික්ඛවෙ, . . . (ස.නි. 5(1), 14)

මෙම ප්‍රථම අංග හතර පොදුවේ සියලු දෙනාටය. මෙම අංග මැනවින් අනුගමනය කිරීමෙන් ආර්ය භූමියට එළඹීම සඳහා අවශ්‍ය පදනම සකස් වේ. ආර්ය මාර්ගයෙහි පස්වන අංගය වන සම්මා ආජීවය අනුගමනය කිරීමෙන් ආර්යභූමියට පත්විය හැකි බව එම මාර්ගාංගය හඳුන්වා දීමේ දී යොදාගන්නා 'අරියසාවක' යන වචනයයෙන් ම සනාථ වේ.

කතමො ච භික්ඛවෙ, සම්මා ආජීවො? ඉධ භික්ඛවෙ, අරියසාවකො . . . (ස.නි. 5(1), 14)

ආර්ය භූමියට පත් ශ්‍රාවකයාගේ මීළඟ අරමුණ වන්නේ ගිහිගෙය අතහැර පැවිදි බිමට පත්වීමයි. එබැවින් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි අවසන් අංග තුන භික්ෂුව මුල්කොට දේශනා කොට ඇත.

කතමො ච භික්ඛවෙ, සම්මාවායාමො? ඉධ භික්ඛවෙ, භික්ඛු . . .
කතමා ච භික්ඛවෙ, සම්මාසති? ඉධ භික්ඛවෙ, භික්ඛු . . .
කතමා ච භික්ඛවෙ, සම්මාසමාධි? ඉධ භික්ඛවෙ, භික්ඛු . . . (ස.නි. 5(1), 14-16)

ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි එන අංග අට අනුගමනය කිරීමෙන් සේඛ වන බවත් සම්මා ඤාණ සහ සම්මා විමුත්ති යන අංග දෙක ද සහිත වූ දසාංගය පූරණය කිරීමෙන් රහත්භාවයට පත්වන බවත් මහාචත්තාරීසක සූත්‍රය පෙන්වා දෙයි.

ඉති ඛො භික්ඛවෙ, අට්ඨඞ්ගසමන්නාගතො සෙඛො දසඞ්ගසමන්නාගතො අරහා හොති. (ම.නි. 3, 218)

උක්ත කරුණු සැලකිල්ලට ගැනීමේ දී ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුපූර්ව ප්‍රතිපදාවක් බවත් එය පිළිවෙළින් අනුගනය කිරීමෙන් ආර්ය භූමිය කරා ළඟාවිය හැකි බවත් පැහැදිලි වේ.

**ආශ්‍රේය ග්‍රන්ථ**


දීඝ නිකාය, 2, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 2006

මජ්ඣිම නිකාය, 1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 2006

මජ්ඣිම නිකාය, 3, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 2006

සංයුත්ත නිකාය, 5(1), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 2006

සංයුත්ත නිකාය, 5(2), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 2006